## ප්‍රධාන කරුණු ඇතුළත් ලේඛනය (KFD) - නිශ්චල දේපළ
## මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී

1. **නිෂ්පාදනය – නිශ්චල දේපළ**

මෙම නිෂ්පාදනයෙහි / සේවාවෙහි අරමුණ වන්නේ නිශ්චල දේපල මිලදී ගැනීමට අපේක්ෂා කරනු ලබන පාරිභෝගිකයින් වෙත මූල්‍ය පහසුකම් ලබා දීමය. ඒ මගින් නේවාසික හෝ වාණිජ දේපල ලබා ගැනීමට පහසුකම් සලසමින් ඔවුන්ගේ පුද්ගලික හා ව්‍යාපාරික අවශ්‍යතා රැසක් ඉටුකර දීමට බලාපොරොත්තු වනු ලැබේ.

**2. ප්‍රධාන අංග සහ ප්‍රතිලාභ**

අ) පහසු ගෙවීමේ ක්‍රමවේද සඳහා ආකර්ෂණීය පොලී අනුපාත.
ආ) ආකර්ෂණීය වට්ටම්.
ඇ) අවම ණය මුදා හැරීමේ කාල සීමාව.
ඈ) වසර 7ක් දක්වා වූ ආපසු ගෙවීමේ කාලසීමාවන්.
ඉ) කඩිනම් පාරිභෝගික සේවාව.

**3. පොලී අනුපාත සහ අනෙකුත් ගාස්තු**

පොලී අනුපාත පදනම් වන්නේ, කලින් කලට පවතින වෙළඳපල තත්ත්වයන් මත වත්කම් සහ බැරකම් කමිටුව (ALCO) සහ නිශ්චල දේපළ කමිටුව විසින් ගනු ලබන තීරණ මතය. තවද, පාරිභෝගිකයින් ඔවුන්ගේ මාසික වාරික පැහැර හරිනු ලබන අවස්ථාවන්හි දී, ලිපි හුවමාරු සහ නෛතික ගාස්තු සඳහා වන අනෙකුත් ගාස්තු අපි පාරිභෝගිකයින්ගෙන් අය කරනු ලබන්නෙමු.

**4. ව්‍යතිරේක පොලිය / දඩ පොලිය**

පාරිභෝගිකයෙකු මාසික වාරික ක්‍රමවත්ව නොගෙවන්නේ නම්, දඩ පොලී අය කිරීමට අපට සිදු වේ.

**5. අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය**

සියලුම විභව්‍ය පාරිභෝගිකයින්ට, ඉඩම් විකුණුම් ව්‍යාපෘති පිහිටා ඇති ආසන්නතම ශාඛාව වෙත පැමිණ තමන්ගේ අවශ්‍යතා පිළිබඳව සාකච්ඡා කිරීමට ඇරයුම් කරනු ලැබේ. එම සාකච්ඡාවෙන් අනතුරුව, නිශ්චල දේපළ **නියෝජිතයින්** විසින් පාරිභෝගිකයාගේ අවශ්‍යතා මත පදනම්ව, විකිණීමේ ක්‍රියාවලිය සහ MBSL වෙතින් බලාපොරොත්තු වන ඕනෑම මූල්‍ය පහසුකම් අවශ්‍යතාවයක් ඇගයීමට ලක් කර, භාරගෙන එහි කටයුතු ආරම්භ කරනු ඇත.

අනුමත බලතල පැවරීමේ ලේඛනයට (DOA) අනුකූලව අනුමැතිය ලබා ගනු ඇත.

***සම්පූර්ණ මුදල් ගෙවන පාරිභෝගිකයින් සඳහා අවශ්‍ය ලියකියවිලි:**

- වයස අවුරුදු 18 ට වැඩි ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම
- ජාතික හැඳුනුම්පතේ පිටපතක්
- පාරිභෝගිකයා හඳුනා ගැනීමේ පටිපාටිය (KYC)
- පදිංචිය තහවුරු කිරීමේ ලේඛන (බිල්පත් පත්)
- බැංකු විස්තර

***පහසු ගෙවීමේ ක්‍රමයට මුදල් ගෙවන පාරිභෝගිකයින් සඳහා අවශ්‍ය ලියකියවිලි:**

**තනි පුද්ගල පාරිභෝගිකයින්**

- නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත
- ජාතික හැඳුනුම්පතේ පිටපතක්

- පදිංචිය තහවුරු කිරීමේ ලේඛන (බිල්පත් පත්)
- පසුගිය මාස 6ක බැංකු ප්‍රකාශන (පෞද්ගලික සහ ව්‍යාපාරික)
- වැටුප් පත්‍රිකා / විස්තර
- මුදල් ප්‍රවාහ ප්‍රකාශන / ආදායම් සහ වියදම් ප්‍රකාශන
- අනෙකුත් ආදායම් තහවුරු කිරීමේ ලේඛන

**ආයතනික පාරිභෝගිකයින්:**

**සීමිත වගකීම් සහිත සමාගම් / ලැයිස්තුගත සමාගම්:**

- සංස්ථාගත කිරීමේ සහතිකය
- සංස්ථාපිත ව්‍යවස්ථාව (සංගම් ව්‍යවස්ථාව)
- 1 වන ආකෘති පත්‍රය, නවතම 13 වන ආකෘති පත්‍රය, 15 වන ආකෘති පත්‍රය, 20 වන ආකෘති පත්‍රය ආදියේ පිටපත්
- බදු ගෙවීමේ කුවිතාන්සි / ආදායම් බදු (නවතම)
- ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපත )
- අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතයන්
- පසුගිය වසර තුනක විගණනය කරන ලද ගිණුම් වාර්තා

**6. ප්‍රධාන නියමයන් සහ කොන්දේසි - සුදුසුකම්**

**අ)** වයස අවුරුදු 18 ට වැඩි ශ්‍රී ලාංකික පුරවැසියන් වීම.

**ආ)** ණයකරුගේ ණය සුදුසුකම, ආපසු ගෙවීමේ හැකියාව, ව්‍යාපාර/දේපළ තක්සේරුව සහ ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ (CRIB) වාර්තාවන් මත පදනම්ව මූල්‍ය පහසුකම අනුමත කරනු ලැබේ.

**7. නිෂ්පාදිතයන් / සේවාවන් සඳහා අදාළ වන නෛතික ප්‍රතිපාදන**

- ශ්‍රී ලංකාවේ පොදු නීතිය
- ශ්‍රී ලංකාව තුළ බලපවත්වන ගිවිසුම් නීතිය
- ශ්‍රී ලංකාවේ අදාළ වන දේපළ නීති මූලධර්ම
- හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත සහ ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත
- වංචා වැළැක්වීමේ ආඥාපනත

**8. පැමිණිලි මෙහෙයවීමේ ක්‍රියා පටිපාටිය**

කරුණාකර පාරිභෝගික පැමිණිලි, පාරිභෝගික පැමිණිලි භාර ප්‍රධාන නිලධාරියා - පැමිණිලි මෙහෙයවීමේ නිලධාරී (වැඩබලන) වෙත යොමු කරන්න. එම පැමිණිල්ල නිශ්චල දේපළ අංශය වෙත ඉදිරිපත් කරනු ඇත.

"**සැකකටයුතු ගනුදෙනු සහ නියමිත සීමාවන් ඉක්මවන ගනුදෙනු (මිලියන 1ට වැඩි) අනුකූලතා අංශය හරහා මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරනු ලැබේ**."